# (එ) සේවා නියුක්තිය සහ කම්කරු සම්බන්ධතා

ආර්ථිකයෙහි සෑම අංශයක්ම අලලා සැකසුණු සේවා නියුක්ති සංඛ්‍යා දත්තයන් ලබාගත හැක්කේ, සංගණන වර්ෂයන් සඳහා පිළියෙල කොට ඇති සංගණන වාර්තා සහ තෝරාගත් අවුරුදු කීපයක් සඳහා ඇති නියැදි සමීක්ෂණයන්ගෙන් පමණි. නොකඩවා සැපයෙන සංඛ්‍යා තොරතුරු නොමැති හෙයින්, වර්තමාන සේවා නියුක්ති තත්වය පිළිබඳව විග්‍රහයක් කිරීමට මෙහි දී උත්සාහයක් දරා නොමැත.

රැකී රක්ෂා කාර්යාලයන් මගින් රැකියාවන් සපයා ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව, 1967 වර්ෂයේ දී 4,254 සිට 1968 දී 5,729 ක් දක්වා ඉහළ ගියේය. මෙම සංඛ්‍යාවන්ට, රැකී රක්ෂා කාර්යාලයන්ගෙන් නොවිමසා රැකියාවන් හී නිරත කෙරුණු සංඛ්‍යාව ඇතුළත් නොවන හෙයින්, මෙමගින්, රටෙහි සේවා නියුක්ති තත්වයෙහි සිදුවූ වෙනස් වීම ප්‍රමාණවත් ලෙසකින් පිළිබිඹු නොකෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, රජයේ දෙපාර්තමේන්තු සහ අර්ධ රාජ්‍ය අංශය (රාජ්‍ය සංයුක්ත මණ්ඩලත්, විශ්ව විද්‍යාලත්, පර්යේෂණ ආයතනත්, සහ මණ්ඩලත් යනාදිය ) හසුවන පරිදි සේවා නියුක්තිය පිළිබඳව, වාර්ෂික සමීක්ෂණයක් පවත්වා ගෙන යනු ලැබේ. මෙකී සමීක්ෂණයට අනුව, එයට අසු වී ඇති රජයේ දෙපාර්තමේන්තු සහ අර්ධ රාජ්‍ය අංශය බොහොමයකම, සේවා නියුක්තියෙහි සාමාන්‍ය තරමේ වැඩිවීමක් දක්නට තිබුණි. රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්තිය සියයට 2.9 ක සහ අර්ධ-රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය සියයට 14.1 ක මුළු වැඩි වීමක් සිදුවී ඇත. රාජ්‍ය අංශයෙහි, ඉඩම් සංවර්ධන, ගොවිජන සේවා සහ කැලෑ දෙපාර්තමේන්තු වල සැලකිය යුතු වැඩිවීමක් වාර්තා ගත වී ඇත. මෙම දෙපාර්තමේන්තුවල වැඩිවීමේ සියයට ගණන පිළිවෙලින්, 13.0,8.6, සහ 5.6 ක් වීය.

අර්ධ–රාජ්‍ය අංශයෙහි, සේවා නියුක්තියේ සැලකිය යුතු වැඩිවීම්, අතර, රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාවෙහි සියයට 23.7 ක්ද, සහ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයෙහි සියයට 11.8 ක් ද දක්නට තිබුණි. සංයුක්ත මණ්ඩලයන්හී ආයෝජන කටයුතු වල ප්‍රසාරණය වීමක් මෙකී සංඛ්‍යාවන් තුළින් පිළිබිඹු කෙරෙයි.

මෙම සමීක්ෂණය, සේවකයන් කොටස් හතරකට වර්ග කොට දක්වා ඇත.

(1) පරිපාලක, කාර්මික ශිල්පීය සහ වෘත්තීය
(2) සහායක
(3) සුළු සේවකයෝ සහ
(4) වෙනත් ( II (ඌ) 1 සංඛ්‍යා සටහනෙහි ඇති සටහන් බලන්න. ) රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්තියෙහි මුළු වැඩිවීමෙන්, සියයට 55 කට ආසන්න ප්‍රමාණයක්, සහායක සේවකයන් වූ අතර, සියයට 31 ක් පමණ සුළු සේවකයන් ද, පරිපාලන කාර්මික සහ වෘත්තීය සේවකයන් සියයට 9 ක්ද වූහ. අර්ධ රාජ්‍ය අංශයෙහි මෙම අනුපාතිකයන් වෙනස් වීය. මෙම අංශයෙහි වැඩි වීමෙන් සියයට 70 ක් පමණ සුළු සෙවකයන්ගෙන් ද, සහායක සේවකයන් සියයට 18 ක් ද, පරිපාලක, කාර්මික ශිල්පීය සහ වෘත්තීය සේවකයන් සියයට 6 ක් ද වීය.

( පෞද්ගලික අංශයෙහි කර්මාන්තයන්හි සේවා නියුක්තිය සම්බන්ධයෙන්, මහ බැංකුව පැවැත් වූ කාර්මික නිෂ්පාදන සමීක්ෂණ හෙළි කළ තොරතුරු මෙම වාර්තාවේ II (ආ) කොටසෙහි විස්තරාත්මකව සාකච්ඡා කොට ඇත. ) එයට හසු වී ඇති සියළු ම ආයතනයන් හි මුළු සේවා නියුක්තිය 1967 වර්ෂයේ දී 74,000 සිට 1968 දී 1,01,000 දක්වා ඉහළ ගොස් ඇත. මෙසේ 27,000 කින් හෙවත් සියයට 36 කින් වැඩි වීමට ඉවහල් වී ඇත්තේ සේවක සංඛ්‍යාව සමීක්ෂණයට හසු වී ඇති නොයෙකුත් කාර්මික ගණයන්හි ආයතන සංඛ්‍යාව වැඩිවීම හා රජයේ කාර්මික සංස්ථා ගණන වැඩිවීමයි. කෙසේ වුවද, මෙකී සංඛ්‍යාවන් මගින් පෞද්ගලික අංශයෙහි කර්මාන්තයන් හී සේවා නියුක්තයෙහි වැඩිවීමක් සිදුවී ඇති බව විද්‍යාමාන වේ.

රැකියාවක් ලබා ගැනීමට හෝ වඩා යහපත් රැකියාවක් ලබා ගැනීම සඳහා හෝ රැකී රක්ෂා කාර්යාලයෙහි ලියා පදිංචි වූවන් ගේ සංඛ්‍යාවෙහි ඉහළ යාම 1968 වර්ෂයේදී සියයට 6.9 ක් වූ අතර, මෙය ඉකුත් වර්ෂයෙහි ඉහළ යාම වූ සියයට 7.6 ට වඩා අඩු වීය. ලියා පදිංචි වූවන්, (අ) ශිල්පීය සහ ලිපිකරු, (ආ) පුහුණු, (ඇ) අර්ධ පුහුණු සහ (ඈ) නුපුහුණු යනුවෙන් කොටස් හතරකට වර්ග කොට ඇත. සියයට 10.3 ක් වූ 1968 දී වැඩි ම ඉහළයාම නුපුහුණු කොටසෙහි වීය. ලියාපදිංචි වූවන්ගේ මුළු සංඛ්‍යාවෙන් නුපුහුණු කම්කරුවන් සියයට 37.8 ක් වීය.

වැඩ වර්ජන සංඛ්‍යාවෙන් විද්‍යාමානවූ පරිදි, 1968 දී ඉකුත් වසරට වඩා පෞද්ගලික අංශයෙහි කම්කරු සම්බන්ධතාවයන් යහපත්වූ බව පෙනේ. 1967 දී 230 ක්වූ වැඩ වර්ජන සංඛ්‍යාවත් හා සසඳන කල, 1968 වර්ෂයේ දී සිදු වූ වැඩ වර්ජන සංඛ්‍යාව 166 ක් පමණි. සම්බන්ධවූ කම්කරු සංඛ්‍යාවද ඉකුත් වර්ෂයට වඩා අඩු විය. කෙසේ වුවද, අපතේ ගිය මිනිස් දින ගණන ඉකුත් වර්ෂයට වඩා වැඩි විය. වැඩිවූ අපතේ ගිය මිනිස් දින සංඛ්‍යාවට ප්‍රධාන වශයෙන් හේතුවූයේ තේ වතුවල සහ කොළඹ වරායේ පැවැති වැඩ වර්ජනයන්ය. වැඩ වර්ජනයන්ට මූලික හේතුව වූයේ සේවකයන් අස් කිරීම හෝ සේවාව අහිමි වී යෑමයි. වැඩ වර්ජන සංඛ්‍යාවෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් ඇතිවූයේ මෙම හේතූන් නිසාය.

1968 නොවැම්බර් මාසයේ දී රජයේ සේවකයන් ගෙන් කොටසක් වැඩ නැවැත් විය. වේතනයන් වැඩි කිරීමට කළ ඉල්ලීම ප්‍රධාන කොට වැඩ වර්ජනය පැන නැඟුන අතර, මෙම වර්ජනය සති හතරක් පමණ පැවැතිනි.

**සේවා නියුක්තියෙහි යොදවන ලද සංඛ්‍යාව**

පහත දැක්වෙන II (ඒ) 1 සංඛ්‍යා සටහනෙහි, රැකී රක්ෂා කාර්යාලයන් විසින් සේවා නියුක්තියෙහි යොදවන ලද පුද්ගලයන්ගේ සංඛ්‍යාව දක්වා ඇත. සේවා නියුක්තියෙහි යොදවන ලද 5,729 ක් වන මුළු සංඛ්‍යාවෙන්, සියයට 13.3 ක් කාර්මික ශිල්පීය සහ ලිපිකාර ශ්‍රේණියට අයත් වූ අතර, සියයට 14.0 ක් පුහුණු කම්කරුවන් ගෙන් ද, සියයට 13.7 ක් අර්ධ පුහුණු සහ සියයට 59.0 ක් නුපුහුණු කම්කරුවන් ගෙන් ද සමන්විත වුනි. රැකියාවන් සඳහා ලියාපදිංචිවූ පුද්ගලයන් ගෙන්, රැකියා ලද පුද්ගලයන් සියයට 2.1 කි. 1967 වර්ෂය සඳහා අනුරූප සංඛ්‍යාව සියයට 1.7 කි.

**සංඛ්‍යා සටහන II (ඒ) 1**

**රැකියා ලබා දෙනු ලැබූ අයගේ සංඛ්‍යාව සහ එක් එක් වර්ගය යටතේ ලියාපදිංචිවී ඇති මුළු සංඛ්‍යාවට එහි ඇති සාපේක්ෂ වැදගත්කම**

| | කම්කරු හා ලිපිකරු | | පුහුණු | | අර්ධ පුහුණු | | නුපුහුණු | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රැකියා ලැබූ ගණන | ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනේ සියයට ගණනක් වශයෙන් | රැකියා ලැබූ ගණන | ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනේ සියයට ගණනක් වශයෙන් | රැකියා ලැබූ ගණන | ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනේ සියයට ගණනක් වශයෙන් | රැකියා ලැබූ ගණන | ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනේ සියයට ගණනක් වශයෙන් | රැකියා ලැබූ ගණන | සියයට ගණන |
| 1958 ... | 1,827 | 9.2 | 800 | 5.9 | 1,006 | 3.1 | 2,251 | 4.4 | 5,884 | 5.0 |
| 1959 ... | 1,667 | 8.0 | 1,045 | 7.5 | 1,275 | 3.8 | 3,218 | 5.4 | 7,205 | 5.6 |
| 1960 ... | 1,400 | 5.3 | 771 | 4.6 | 1,247 | 3.6 | 4,744 | 6.5 | 8,162 | 5.4 |
| 1961 ... | 1,259 | 4.6 | 631 | 3.5 | 964 | 2.8 | 2,794 | 3.9 | 5,648 | 3.7 |
| 1962 ... | 1,263 | 3.7 | 468 | 2.7 | 809 | 2.3 | 2,315 | 3.5 | 4,857 | 3.2 |
| 1963 ... | 1,322 | 3.7 | 502 | 3.0 | 836 | 2.3 | 2,466 | 3.9 | 5.129 | 3.4 |
| 1964 ... | 1,722 | 4.4 | 535 | 3.2 | 945 | 2.5 | 3,599 | 5.5 | 6,801 | 4.3 |
| 1965 ... | 1,495 | 2.7 | 846 | 4.2 | 1,035 | 2.1 | 3,753 | 5.0 | 7,129 | 3.6 |
| 1966 ... | 1,056 | 1.6 | 740 | 3.4 | 917 | 1.5 | 4,089 | 4.5 | 6,802 | 2.9 |
| 1967 ... | 1,018 | 1.4 | 588 | 2.5 | 712 | 1.1 | 1,936 | 2.1 | 4,254 | 1.7 |
| 1968* ... | 759 | 1.0 | 803 | 3.2 | 785 | 1.1 | 3,382 | 3.3 | 5,729 | 2.1 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව

*තාවකාලිකයි.

**රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය**

1968 වර්ෂය සඳහා ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද සමීක්ෂණය, ඉකුත් වර්ෂයන්ට වඩා, රජයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ආයතනයන් විශාල සංඛ්‍යාවකින් වඩා සවිස්තරාත්මක තොරතුරු ඉල්ලා සිටියේ ය. රජයේ දෙපාර්තමේන්තු 89 කින් සහ අර්ධ රාජ්‍ය ආයතන 46 කින් ද සංඛ්‍යා තොරතුරු බැංකුවට ලැබුනේය. විමසීම් සම්බන්ධයෙන් ප්‍රතිචාරයක්

නොදක් වූ දෙපාර්තමේන්තු, සේවක සංඛ්‍යා සම්බන්ධයෙන්, 1967-68 සහ 1968-69 වර්ෂයන් සඳහා පිළියෙළවූ රජයේ ආදයම් හා වියදම් ඇස්තමේන්තුවලින් ලබාගත හැකි තොරතුරුවලින් ඇස්තමේන්තු සකසා ගන්නා ලදී.

පහත සඳහන් සංඛ්‍යා සටහනෙහි 1967 සහ 1968 අවසානයේදී සමීක්ෂණයට ලක්වූ (අ) පරිපාලන, ශිල්පීය සහ විධායක වෘත්තීය සේවක (ආ) සහායක සේවකයන් (ඇ) සුළු සේවකයන් (ඈ) අනිකුත් අය (සංඛ්‍යා සටහනෙහි පාද සටහන බලන්න ) යන වර්ගයන් ගේ සේවා නියුක්ති තොරතුරු දක්වේ.

### සංඛ්‍යා සටහන II (එ) 2

### සේවා නියුක්ති සංඛ්‍යා — රජයේ දෙපාර්තමේන්තු

| රැකියා තත්වය | තත්වය හා සේවා නියුක්ති සංඛ්‍යාව | | | | | | | | 1967න් වූ වෙනස සියයට |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථිර | | තාවකාලික | | අනියම් | | එකතුව | | |
| | 1967 | 1968 | 1967 | 1968 | 1967 | 1968 | 1967 | 1968 | |
| 1. පාලන, ශිල්පීය, වෘත්තීය මාණ්ඩලික ශ්‍රෙණියේ නිලධාරීන් | 5,822 | 6,288 | 299 | 331 | 16 | 15 | 6,137 | 6,634 | +8.1 |
| 2. සහායක සේවකයන් | 83,005 | 85,800 | 1,367 | 1,317 | 736 | 865 | 85,108 | 87,982 | +3.4 |
| 3. සුළු සේවකයන් | 78,279 | 79,193 | 2,230 | 2,425 | 6,766 | 7,271 | 87,275 | 88,889 | +1.8 |
| 4. වෙනත් | 3,846 | 4,132 | 309 | 234 | 399 | 456 | 4,554 | 4,822 | +5.9 |
| එකතුව | 170,952 | 175,413 | 4,205 | 4,307 | 7,917 | 8,607 | 183,074 | 188,327 | +2.9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සංලක්ෂ්‍ය : 1. (i) ව්‍යවස්ථාදයක නිලධාරීන් හා ආණ්ඩුවේ පාලක නිලධාරීන්.
(ii) කළමනාකරු, සභාපති සහ වෙනත් මාණ්ඩලික ශ්‍රෙණි නිලධාරීන්.
(iii) විද්‍යාඥයන්, ඉංජිනේරුවන් සහ කාර්මික නිලධාරීන්, වෛද්‍යවරුන්, මහාචාර්යවරුන් සහ කථිකාචාර්යවරුන්, ගණකාධිකාරීන් සහ තක්සේරුකරුවන්.
2. (i) ලිපිකරු ශ්‍රෙණි; සරප්වරු, ලඝුලේඛකයන්, යතුරු ලේඛකයන් සහ සයිපර් ක්‍රියා කරවන්නන්.
(ii) දුරකථන සේවකයන් හා කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරවන්නන්, පරිවර්තකයන්, ව්‍යාප්ති පරීක්ෂණ හා විමර්ෂණ සේවකයන්, පොලිස් හා ග්‍රාමසේවකයන්.
(iii) ගබඩා භාරකාරයෝ.
3. (i) පණිවුඩකරුවෝ, කාර්යාල කාර්ය සහායක, උපස්ථායක හා ඔඩර්ලිවරු, රියැදුරු (මෝටර් රථ හා ලොරි ආදිය), නුපුහුණු කම්කරුවන්, අර්ධ පුහුණු කම්කරුවන්
(ii) පුහුණු කම්කරුවන්.

ඉහත සඳහන් සංඛ්‍යා සටහනට අනුව සමීක්ෂණයට හසුවූ ( 1968 වර්ෂයේ ) රජයේ දෙපාර්තමේන්තුවල සේවකයන් ගෙන් සියයට 93 කට වැඩි ගණනක් සහාය සහ සුළු සේවක ශ්‍රේණීන්ට අයත්වූ අතර, සියයට 3 ක් පමණ පරිපාලන වෘත්තීය සහ ශිල්පීය ශ්‍රෙණියට අයත් වුනි. සහායක සහ සුළු ශ්‍රෙණීන් සඳහා අයත්වූ ප්‍රමාණයන් පිළිවෙළින් සියයට 46.7 ක් සහ සියයට 47.2 කි. 1968 වර්ෂය අවසානයේ දී සේවකයන් ගෙන් සියයට 93.1ක් ස්ථිර සේවකයන් වූ අතර සියයට 2.3 ක් තාවකාලික සහ 4.6 ක් අනියම් සේවකයන් ද වූහ.

සමීක්ෂණයට හසුවූ රජයේ දෙපාර්තමේන්තු සේවකයන් ගේ මුළු සංඛ්‍යාව 1967 අවසානයේ දී 183,074 සිට 1968 අවසානයේ දී 188,327 දක්වා ඉහළ ගියේ ය. මෙකී වැඩි වූ සංඛ්‍යාවෙන් සහායක ශ්‍රෙණියට සියයට 54.7 අයත්වූ අතර, සුළු සේවක ශ්‍රෙණියෙහි සියයට 30.7 සහ පරිපාලන ශිල්පීය සහ වෘත්තීය ශ්‍රෙණියෙහි සියයට 9.5 ක් ද වූහ.

1967 සහ 1968 අවසානයේදී අර්ධ රාජ්‍ය ආයතනයන්හී සේවා නියුක්තිය පහත දක්වෙන සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

## සංඛ්‍යා සටහන II (ඒ) 3
## සේවා නියුක්ති සංඛ්‍යා — අර්ධ රාජ්‍ය ආයතන

| රැකියා තත්වය | තත්වය හා සේවා නියුක්ති සංඛ්‍යාව | | | | | | | | 1967 න් වූ වෙනස සියයට |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථිර | | තාවකාලික | | අනියම් | | එකතුව | | |
| | 1967 | 1968 | 1967 | 1968 | 1967 | 1968 | 1967 | 1968 | |
| 1. පාලන, ශිල්පීය වෘත්තිය සහ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් | 3,177 | 4,024 | 235 | 345 | — | 13 | 3,412 | 4,382 | +28.4 |
| 2. සහායක සේවකයන් | 19,415 | 22,229 | 718 | 824 | 261 | 280 | 20,394 | 23,333 | +14.4 |
| 3. සුළු සේවකයන් ... | 67,937 | 73,531 | 3,138 | 3,536 | 16,372 | 21,675 | 87,447 | 98,742 | +12.9 |
| 4. වෙනත් | 2,347 | 3,118 | 23 | 25 | 216 | 306 | 2,586 | 3,449 | +33.4 |
| එකතුව ... | 92,876 | 102,902 | 4,114 | 4,730 | 16,849 | 22,274 | 113,839 | 126,906 | +14.1 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

II (ඒ) 2 හි සංලක්ෂ්‍යයන් මෙම සංඛ්‍යා සටහනටද යෙදිය හැකිය.

විමසීම් සඳහා පිළිතුරු එවූ අර්ධ රාජ්‍ය ආයතනයන් 46 හි මුළු සේවකයන් අතුරින් සියයට 18.0 ක් සහ සියයට 76.0 ක් පිළිවෙලින්, සහායක සහ සුළු සේවකයන් වූහ. පරිපාලන, ශිල්පීය සහ වෘත්තීය සේවකයන් ගේ අනුපාතය සියයට 3.4 කි. 1968 අවසානයේ දී සේවකයන් ගෙන් සියයට 79.2 ක් ස්ථිර සේවකයන් වූ අතර, තාවකාලික සේවකයන් සියයට 3.6 ක් ද, අනියම සේවකයන් සියයට 17.1 ක් ද වූහ. අර්ධ රාජ්‍ය ආයතනයන් 46 හි සේවක සංඛ්‍යාව 1,29,906 දක්වා, 16,067 කින් වැඩි විය. මෙකී වැඩිවූ සංඛ්‍යාවෙන් සුළු සේවකයන් සියයට 70.3 කින් සමන්විත වූ අතර සියයට 18.3 කින් සහායක සේවකයන් ද සියයට 6.0 කින් පරිපාලන, ශිල්පීය සහ වෘත්තීය සේවකයන්ද සමන්විත වූහ. සමීක්ෂණයට හසු වූ අර්ධ රාජ්‍ය ආයතනයන්හි වැඩිවීමේ ප්‍රතිශතය, සියයට 14.1 ක් විය. රාජ්‍ය ඉංජිනේරු කාර්මික සංයුක්ත මණ්ඩලයෙහි සියයට 23.7 කින් ද, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයෙහි සියයට 11.8 කින්ද, යනාදී වශයෙන් සැලකිය යුතු වැඩිවීම් වාර්තාගත වුනි.

### රැකියාවන් පතා ලියාපදිංචි වූවන්

1968 වර්ෂයේ දී රැකියාවන් හෝ වඩා යහපත් රැකියාවන් පතා රැකී රක්ෂා කාර්යාලවල ලියාපදිංචිවූ සංඛ්‍යාව සියයට 6.9 කින් වැඩි විය. ( පරිශිෂ්ඨයෙහි දැක්වෙන 45 වැනි සංඛ්‍යා සටහන බලන්න ) ඉකුත් වර්ෂය සඳහා වූ සංඛ්‍යාව සියයට 7.6 කි. විවිධ ශ්‍රේණීන් හි වැඩිවීම් ශිල්පීය සහ ලිපිකරු ශ්‍රේණියෙහි සියයට 3.7 ද, පුහුණු වූ ශ්‍රේණියෙහි සියයට 5.7 ද, සියයට 6.1 ක් අර්ධ පුහුණු ශ්‍රේණියට, සියයට 10.3 ක් නුපුහුණු ශ්‍රේණියටද, අයත් විය. ඉකුත් වර්ෂයෙහි සංසන්දනාත්මක සංඛ්‍යාවන් පිළිවෙලින් සියයට 9.9, 8.9, 10.9 සහ 3.5 යනාදී වශයෙන් විය.

### කම්කරු සම්බන්ධතා 1

1968 වර්ෂයේ දී, පෞද්ගලික අංශයෙහි වැඩ වර්ජන සහ ඒවාට සහභාගි වූ කම්කරුවන් සංඛ්‍යාව, ඉකුත් වර්ෂයට වඩා අඩු විය. 1967 වර්ෂය හා සසඳන කල්හී 1968 වර්ෂයේ දී මුළු වැඩ වර්ජන සංඛ්‍යාව 166 ක් ද, ඒවාට සහභාගි වූ කම්කරුවන් ගේ සංඛ්‍යාව 64,810 ක් ද වූ අතර, ඉකුත් වර්ෂයේ දී වැඩ වර්ජන 230 ක් සිදුවී ඇති අතර, කම්කරුවන් 89,851 ක් දෙනෙක් ඒවාට සහභාගි වී ඇත. දළ වශයෙන් වැඩ වර්ජනවලින් සියයට 88 ක් ම වැවිලිකරයෙහි වූ අතර, ප්‍රධාන වශයෙන් ම තේ වතුවල විය. ඒ සඳහා වැඩ වර්ජනවලට සහභාගිවූ මුළු කම්කරු සංඛ්‍යාවෙන් සියයට 86 ක් විය. 1968 නොවැම්බරයේ දී සති හතරක් පමණ පැවැති රජයේ සේවකයන් කොටසක ගේ වැඩ වර්ජනයක් ද විය. වේතන වැඩි කිරීම සඳහා වන ඉල්ලීම ප්‍රධාන කොට ගෙන, මෙම වැඩ වර්ජනය පැන නැගුණි.

1. මෙම වාර්තාව පිළියෙල කරන අවස්ථාවේදී, වර්ෂය සඳහා වැඩ වර්ජන සහ අපතේ ගිය මිනිස් දින ගණන් පිළිබඳ ලැබූ සංඛ්‍යා තාවකාලික ඒවාය.

II (එ) 4 සංඛ්‍යා සටහන පෞද්ගලික අංශයේ සිදු වූ වැඩ වර්ජනයන් හේතු කොට ගෙන වැඩ වර්ජන සංඛ්‍යාව, සහභාගි වූ කම්කරුවන් සංඛ්‍යාව සහ අපතේ ගිය මිනිස් දින ගණන පෙන්වයි.

### සංඛ්‍යා සටහන II (එ) 4

### වැඩ වර්ජන — පෞද්ගලික අංශය වෘත්තීන්

| වර්ෂය | වතු | | | අනෙක් රැකියාවල් | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | නැති වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | නැති වූ මිනිස් දින ගණන |
| 1956 ... ... ... | 99 | 56,908 | 200,888 | 115 | 31,852 | 152,966 |
| 1957 ... ... ... | 177 | 297.061 | 618,050 | 127 | 70,239 | 190,443 |
| 1958 ... ... ... | 123 | 39,372 | 340,632 | 96 | 42,713 | 399,228 |
| 1959 ... ... ... | 177 | 47,318 | 352,095 | 71 | 42,453 | 460,141 |
| 1960 ... ... ... | 123 | 42,528 | 259,948 | 37 | 4,839 | 15,139 |
| 1961 ... ... ... | 90 | 29,223 | 317,866 | 39 | 38,013 | 170,372 |
| 1962 ... ... ... | 138 | 42,569 | 193,792 | 550 | 25,730 | 801,882 |
| 1963 ... ... ... | 174 | 62,511 | 359,905 | 58 | 21,819 | 479,678 |
| 1964 ... ... ... | 201 | 68,009 | 611,060 | 103 | 21,400 | 274,623 |
| 1965 ... ... ... | 175 | 70,929 | 482,259 | 55 | 10,085 | 89,952 |
| 1966 ... ... ... | 132 | 138,259 | 4,117,264 | 32 | 4,592 | 34,351 |
| 1967 ... ... ... | 194 | 74,968 | 414,636 | 36 | 14,883 | 284,709 |
| 1968* ... ... ... | 146 | 55,817 | 608,276 | 20 | 8,993 | 210,706 |

මූලය : කම්කරු දෙපාර්තමේන්තුව

*තාවකාලිකයි.

වැඩ වර්ජනයන් හේතු කොට ගෙන, අපතේ ගිය මිනිස් දින ගණන 6,99,345 සිට 8,18,982 දක්වා, එනම්, සියයට 17.1 කින් ඉහළ ගියේ ය. 1968 දී අපතේ ගිය මුළු දින ගණනින්, තේ වතුවල පමණක් අපතේ ගිය මිනිස් දින සංඛ්‍යාව සියයට 70 ක් විය. කොළඹ වරායෙහි සහ තේ සහිත රබර් වතුවල අපතේ ගිය මිනිස් දින ගණන මුළු දින ගණනින්, පිළිවෙලින් සියයට 10.2 ක් සහ සියයට 3.7 ක් විය.

1968 දී පැවැති වැඩ වර්ජනයන්ට මුල් වූ හේතූන් විග්‍රහ කිරීමේ දී වැඩ වර්ජනවලින් සියයට 31.3 ක්, සේවකයන් අස් කිරීම හෝ සේවය අහිමිවී යාම හේතු කොට ගෙන සිදුවූ ඒවා බව පෙනේ. පරිපාලන රෙගුලාසි සහ වැඩ කටයුතු සංවිධානය කිරීම නිසා උද්ගතවූ වැඩ වර්ජන සියයට 22.3 ක්වූ අතර, සාමාන්‍ය ඉල්ලීම් නිසා ඇතිවූ වැඩ වර්ජන ගණන මුළු ගණනින් සියයට 10.8 ක් විය.